(අ) මූදල් රෙගුලාසි 208 ප්‍රකාරව තම දෙපාර්තමේන්තුවට වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ගැනීම සෑම ගණන්දීමේ නිලධාරියෙකුගේම වගකීමක් වන අතර වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 15ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දුන් රුපියල් මිලියන 1,045.75 ක ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 615.42 ක් පමණක් වැය කර තිබීම හේතුවෙන් රුපියල් මිලියන 430.34 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ මෙම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කල ව්‍යාපෘති වලින් ඉටුකර ගැනීමට අපේක්ෂා කල අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) අනෙකුත් සැපයුම් වියදම් විෂය අංක 271-1-1-6-1205 සඳහා ලබා දී තිබූ රුපියල් මිලියන 25 ක පරිපූරක ප්‍රතිපාදන වියදම් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. එම හේතුවෙන් පරිපූරක ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂයේදී ඉටුකර ගැනීමට අපේක්ෂා කල වී මිලදී ගැනීමේ කටයුතු ඉටුවී නොතිබුණි.

2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට අදාල විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයට අනුකූල නොවීම.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(i)	මුදල් රෙගුලාසි 571	රුපියල් මිලියන 9.90 ක පොදු තැන්පතු ශේෂ 10 ක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර නොතිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 208 (2) (අ) වගන්තිය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව, ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කල නිවාස ව්‍යාපෘතිය සඳහා ලබා දුන් මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 587.01 ක් වුවද 2019 හා 2020 වර්ෂ වලදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සඳහා මෙම අමාත්‍යාංශය මඟින්

	ක්‍රියාත්මක කර තිබූ නිවාස ව්‍යාපෘතිවල අවිච්ඡේද වැඩ වශයෙන් රුපියල් මිලියන 12.50 ක් සමාලෝචිත වර්ෂයේ නිවාස ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන වලින් අඩුකර තිබීමෙන් සමාලෝචිත වර්ෂය සඳහා මෙම නිවාස ව්‍යාපෘතියට වෙන් කරන ලද ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් මිලියන 574.51 ක් විය. එමෙන්ම මෙම වගන්තියට පටහැනිව නිදහස් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා කන්තලේ හා සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ නිවාස ඉදිකිරීම් වෙනුවෙන් රුපියල් මිලියන 12.49 ක ප්‍රතිපාදනද ලබා දී තිබුණි.

(ආ) රජයේ අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු හා වෙනත් විධිමත් අධිකාරයකින් පිහිටුවා ඇති ආයතන විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන, රෙගුලාසි හෝ මාර්ගෝපදේශ වලට අනුකූල නොවීම්

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(i)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016	තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන 3 ක ඉන්ධන දහන පරීක්ෂාව වසර 7 කට වඩා කාලයක සිට සිදු කර නොතිබුණි.
(ii)	කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 6/2016 හා 8.3 ඡේදය	තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගැබිණි මව්වරුන් සඳහා භාණ්ඩ මිලදී ගැනීමට ලියාපදිංචි වෙළඳ ආයතන පිළිබඳ පසු විපරම් කර වාර්තාවක් ලබා දිය යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි.

(iii)	සමාජ සේවා, සුභසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අංක MSS/ADM/10/2/10 දරන චක්‍රලේඛයේ 2.5 හා 2.6 ඡේදය	තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩිහිටි දීමනා ලාභීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ මියගිය පුද්ගලයින් 25 දෙනෙකුගේ සහතිකපත් අවලංගු කර, එම අවලංගු කරන සහතික පත් ප්‍රාදේශීය ලේකම් භාරයට ගෙන නොතිබුණි.
(iv)	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2018 ජූලි 20 දිනැති අංක 01/2018 චක්‍රලේඛය	
	---	
	5 (iii) ඡේදය	මූතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වසර දෙකකට වඩා වැඩි කාලයක් විදේශගත වූ පුද්ගලයකු සඳහා රුපියල් මිලියන 1.14 ක විශ්‍රාම වැටුප් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.
	6 (ආ) ඡේදය	මූතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විදේශගත වූ විශ්‍රාමිකයින් දෙදෙනෙකු සඳහා මාසිකව ජීවන වියදම් දීමනාව ලෙස රුපියල් 3,525 බැගින් මාස 74 ක් සඳහා චක්‍රලේඛයට පටහැනිව රුපියල් 112,850 ක් ගෙවා තිබුණි.

(v) ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 මැයි 17 දිනැති අංක SMRHC/RD/04/01 දරන චක්‍රලේඛයේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක - 2021

ලකුණු ලබා දීමේ ක්‍රමයේ අංක 6 වගන්තිය	නැවත පදිංචි කිරීමේ වැඩ සටහන යටතේ නිවාසලාභීන් ලෙස ආබාධිත පුද්ගලයින් තෝරා ගැනීමේදී යුද්ධය හෝ ඒ ආශ්‍රිත හේතු නිසා ආබාධිත වූවන් තෝරාගත යුතු වුවත්, විවිධ ස්වභාවික හේතු, වෙනත් අනතුරු හා රෝග නිසා ආබාධිත වූවන් ද ප්‍රතිලාභී පවුල් ලෙස කින්නියා, කුච්චවේලී, ගෝමරන්කඩවල, සේරුවිල, කන්තලේ සහ මොරවැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් තෝරාගෙන තිබුණි. ඒ අනුව රුපියල් 600,000 නිවාස වැඩසටහන යටතේ තෝරා ගෙන තිබූ ප්‍රතිලාභීන් 11 ක් සහ රුපියල් මිලියන 1 නිවාස වැඩසටහන යටතේ තෝරා ගෙන තිබූ ප්‍රතිලාභීන් 16 ක් සඳහා රුපියල් මිලියන 14.40 ක නිවාස ආධාර ලබා දීමට කටයුතු කර තිබුණි.
මූලික සුදුසුකම් පිළිබඳ අංක 03 වගන්තිය	ගැටළුකාරී කාලයේදී සම්පූර්ණයෙන් හානියට පත් නිවාස වල පදිංචි වී සිටි පවුල් සඳහා ස්ථිර නිවාස ලබා දිය යුතු අතර ආරවුල් හේතුවෙන් නිවාස සම්පූර්ණයෙන්ම හානි වූ බවට හෝ

පිටුව 13 | 21

		යුද්ධ කාලයේදී ස්ථිර නිවාස තිබූ බවට හෝ සනාථ වන විධිමත් ලියවිලි පැවතිය යුතු වුවත් කින්නියා, කුච්චවේලී, ගෝමරන් කඩවල, සේරුවිල, කන්තලේ සහ මොරවැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ තෝරා ගෙන තිබූ නිවාස ප්‍රතිලාභීන්ගේ ලිපි ගොනු වල උක්ත සඳහන් විධිමත් ලියවිලි ඇතුලත්ව නොතිබුණි. එමෙන්ම ඉහත දැක්වූ නිර්ණායකයට පටහැනිව රුපියල් මිලියන 1 ක නිවාස වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 162 දෙනෙකුට හා රුපියල් 600,000 ක නිවාස වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 151 දෙනෙකුට එකතුව රුපියල් මිලියන 252.60 ක නිවාස ආධාර ලබාදීමට කටයුතු කර තිබුණි.
(vi)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2021 මාර්තු 25 දිනැති අමතර ඇමුණුම් අංක 35 සහ උපලේඛණ 2.14.1 ඡේදය	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ ප්‍රසම්පාදනයන්ගේ උපරිම වටිනාකම රුපියල් මිලියන 1 ක් වුවද මෙම සීමාව ඉක්මවා මූතූර් සහ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි අවස්ථා 8 කදී එකතුව රුපියල් මිලියන 6.90 ක භාණ්ඩ ප්‍රසම්පාදන කර තිබුණි. එම හේතුවෙන් තරඟකාරී ප්‍රසම්පාදන වාසි ලබාගැනීමට නොහැකිවී තිබුණි.

(ඇ) ආයතනයේ කළමනාකරණ හා අභ්‍යන්තර නියෝගවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවාසලාභීන් ලෙස අනු පවුල් තෝරා ගැනීමේදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්ගේ 2016 සැප්තැම්බර් මස GAT/EST/RESET/HOU/VOLII/ 2016 දරන ලිපිය	නැවත පදිංචි වීමට පෙර විවාහ වී සිටින පවුල් පමණක් නැවත පදිංචි කිරීමේ වැඩසටහනට තෝරාගත යුතු වුවත්, නැවත පදිංචි වීමෙන් පසු වර්ෂවල විවාහ වූ පුද්ගලයින් ද ප්‍රතිලාභී පවුල් ලෙස සලකා කින්නියා, ගෝමරන්කඩවල, සේරුවිල, කන්තලේ සහ මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් තෝරාගෙන තිබූ අතර රුපියල් මිලියන 1 ක නිවාස ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 42 ක් හා රුපියල් 600,000 ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 24 ක් ලෙස ප්‍රතිලාභීන් 66 දෙනෙකුට රුපියල් මිලියන 56.40 ක් ගෙවීමට කටයුතු කර තිබුණි.

2.6 අවිධිමත් ගනුදෙනු

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණු ගනුදෙනු

(i) සේරුවිල සහ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා රුපියල් 5000 දීමනාව ලබා දීමේදී අදාල ප්‍රතිලාභීන් තෝරා ගැනීම චක්‍රලේඛයේ විධි විධාන වලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුලදී පුද්ගලයින් 178 ක් සඳහා අවස්ථා 2,124 කදී එකතුව රුපියල් මිලියන 10.62 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ii) අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ 2021 දෙසැම්බර් 30 දිනැති අංක GAT/EST/RESET/SMHC/HP/02/2021 දරන ලිපිය මඟින් කන්තලේ සහ සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා රුපියල් 600,000 ක නිවාස වැඩසටහන යටතේ අතිරේක නිවාස 21 ක් ලබා

දී තිබූ අතර අග්‍රිම ප්‍රතිපාදන නොතිබියදී එලෙස අතිරේක නිවාස 21 ක් සඳහා රුපියල් 150,000 බැගින් පළමුවන වාරිකය ලෙස රුපියල් මිලියන 3.15 ක් ගෙවා තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ගිණුම් චක්‍රලේඛ අංක 02/2018 හා 2018 ජනවාරි 29 දිනැති චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මහජනයා වෙත සපයන සේවා ප්‍රමුඛතා ගත කොට ප්‍රධාන සේවාවන් 5 කට අදාළව ප්‍රශස්ත ඉලක්කයන් තීරණය කර එම ඉලක්ක පිළිබඳ වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම චක්‍රලේඛයේ 2.5 හා 2.6 ඡේදයන්ට අනුව සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රශස්ත ඉලක්කයන් සාරාංශගත කොට සකස් කරන ලද වාර්තාවක් විගණකාධිපතිටද පිටපත් සහිතව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සෑම වර්ෂයකම ජනවාරි 15 වන දිනට පෙර ඉදිරිපත් කල යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමාලෝචිත වර්ෂයට අදාළව එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන - 2021 යටතේ අංශ 14 ක් සඳහා රුපියල් මිලියන 41.53 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර එම ප්‍රතිපාදනය සියළු අංශ සඳහා ප්‍රමුඛතා පදනම මත වෙන් නොකර ලියාපදිංචි පෙරපාසල්, දහම්පාසල්, සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා භාණ්ඩ ලබා දීම වෙනුවෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 240 ක් සඳහා රුපියල් මිලියන 13.07 ක් හා තරුණ හා කාන්තාවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා භාණ්ඩ ලබා දීම වෙනුවෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 103 ක් සඳහා රුපියල් මිලියන 15.32 ක් වශයෙන් එකතුව රුපියල් මිලියන 28.39 ක් ලබා දී තිබූ අතර අනෙක් අංශ 12 වෙනුවෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 138 ක් සඳහා රුපියල් මිලියන 13.14 ක් පමණක් ලබා දී තිබුණි. නමුත් 2021 ජනවාරී 11 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක MFNPD/07/2021 දරන ලිපියේ 2.4 ඡේදය අනුව විවිධාංගීකරණය වූ අයවැය අරමුදල් සැපයීම හා බෙදාහැරීම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවත්වන පුද්ගලයින් සංඛ්‍යාව, දිළිඳුකම සහ භූමි ප්‍රමාණය මත පදනම්ව සාධාරණ ආකාරයකින් සිදු කල යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එලෙස කටයුතු කර නොතිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම වෙනුවෙන් "ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය" යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ග්‍රාම ශක්ති ජනතා සමිති 33 ක් සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 52.19 ක් ලබා දී තිබුණද මෙම වැඩසටහන ක්‍රියාත්මක නොවීම හේතුවෙන් රජයේ අරමුදල් අපේක්ෂිත පරමාර්ථ ඉටු කර ගැනීම වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

3.1.3 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ "2021 වර්ෂයේ නිවාස යෝජනා ව්‍යාපෘතිය" සම්බන්ධයෙන් කුච්චවේලි, කින්නියා, මොරවැව, කන්තලේ, ගෝමරන්කඩවල සහ සේරුවිල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5 හි සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්ගේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් නැවත පදිංචි කිරීමේ සැලැස්මේ 2.3වගන්තිය අනුව කින්නියා, ගෝමරන්කඩවල, කුච්චවේලි, සේරුවිල, කන්තලේ සහ මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නැවත පදිංචි කිරීමේ කාර්යය වෙනුවෙන් ග්‍රාම නිලධාරි වසම් 29 ක් හඳුනාගෙන තිබුණද, උක්ත අමාත්‍යාංශය මඟින් 2021 වර්ෂය සඳහා උතුරු හා නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක කරන නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කින්නියා, ගෝමරන්කඩවල, කුච්චවේලි, සේරුවිල, කන්තලේ සහ මොරවැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් "ත්‍රිකුණාමලය දිස්ත්‍රික් නැවත පදිංචි කිරීමේ සැලැස්මේ" ඇතුලත් නොවූ ග්‍රාම නිලධාරි වසම් 97 ක් සඳහා රුපියල් 600,000 ක නිවාස 142 ක් හා රුපියල් මිලියන 1 ක නිවාස 142 ක් සඳහා එකතුව රුපියල් මිලියන 227.20 ක් ලබා දී තිබුණි .

3.1.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමෘද්ධි ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ආධාර යටතේ කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ක්‍රියාත්මක කල "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය" යටතේ සෞභාග්‍යා නිෂ්පාදන සමිති 2 ක් සඳහා රුපියල් මිලියන 5.68 ක් වටිනා මාළු වියලන යන්ත්‍රයක් හා ලුණු ඇඹරුම් යන්ත්‍රයක් ලබා දී තිබුනද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගෙන නිෂ්කාර්යව රඳවා තබා ගෙන තිබුණි.

(ආ) සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය" යටතේ කුකුළු පැටවුන් බෙදා දීමට කටයුතු කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රුපියල් මිලියන 2.25 ක් වූ කුකුළු පැටවුන් 2625 ක් බෙදා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි.

3.1.5 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන - 2021" ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් යටතේ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිලාභීන් 242 දෙනෙකුට රුපියල් මිලියන 16.34 ක් වටිනා පශු සම්පත් 13714 ක් ලබා දී තිබුනද ප්‍රතිලාභීන් 164 ක් සඳහා ලබා දුන් රුපියල් මිලියන 2.84 ක් වටිනා පශු සම්පත් 3299 ක් අහිමි වී තිබීමෙන් මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ප්‍රශස්ත ලෙස ඉටු වී නොතිබුණි.

3.1.6 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ "ක්‍රීඩා පිට්ටනි සංවර්ධන වැඩසටහන - 2021" මඟින් කන්තලේ, නගර හා කඩවත් හා කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ජාතික පාසල් 3 ක් වෙනුවෙන් රුපියල් මිලියන 9.83 ක් වෙන්කර තිබුනද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වැඩ අවසන් කර නොතිබුණි. එමෙන්ම කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ක්‍රියාත්මක කල පිරිවැය රුපියල් මිලියන 2.46 ක් වූ පිට්ටනිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දමාද තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කොන්ත්‍රාත් පරිපාලන කටයුතුවල අකාර්යක්ෂමතාවය මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

(ආ) ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2021 යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉටු කල යුතු ව්‍යාපෘති 222 ක් නිම නොකර අත්හැර දමා තිබූ අතර රුපියල් මිලියන 338.9 ක් වූ වාර්ෂික ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රුපියල් මිලියන 18.26 ක් පමණක් වියදම් කර තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සෞභාග්‍යා ව්‍යාපෘතිය යටතේ රුපියල් 947,625 ක් පිරිවැය වූ ඇඹරුම් යන්ත්‍ර 15 ක් මිලට ගෙන තිබුණද විගණිත දිනය වන 2022 ජනවාරි 31 දින වන විටත් ගබඩාවෙහි රඳවා තිබූ අතර එම භාණ්ඩ එදින වන විටත් නිෂ්කාර්ය වත්කම් ලෙස පැවතුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය නිවාස ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පිරිවැය රුපියල් මිලියන 3.64 ක් වැය කර ප්‍රතිලාභීන් 52 ක් සඳහා සනීපාරක්ෂක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී නැවත පදිංචි කිරීමේ ගම්මාන වලින් පමණක් අමාත්‍යාංශයේ නිර්ණායක මත පදනම්ව තෝරාගැනීම් සිදු නොකර පිරිවැය රුපියල් මිලියන 1.75 ක් නැවත පදිංචි කිරීමේ ගම්මාන නොවන වෙනත් ගම්මාන වලින් ප්‍රතිලාභීන් 25 දෙනෙකු තෝරා ගෙන ගෙවා තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කල සමෘද්ධි සහනාධාර වාර්තාව අනුව ඉකුත් වර්ෂයේ ත්‍රීකුණාමලය දිස්ත්‍රික්කයට අදාල සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 61178 ක් වූ අතර මාසික සමෘද්ධි දීමනා වියදම රුපියල් මිලියන 131.06 ක් වුවද ඊට අනුරූපිව සමාලෝචිත වර්ෂයේ සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 60402 ක් ලෙස පවුල් ඒකක සංඛ්‍යාව 776 කින් අඩු වී තිබුණද සමාලෝචිත වර්ෂයේ සමෘද්ධි දීමනා වියදම රුපියල් මිලියන 1572.72 සිට සිට රුපියල් මිලියන 1826.28 ක් දක්වා රුපියල් මිලියන 253.56 කින් වැඩි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ සිටින දරිද්‍රතාවයෙන් පෙලෙන ජනගහනය 31,698 ක් වුවද සමෘද්ධි සහනාධාර වාර්තාව අනුව සමෘද්ධි ලබාගත් සමෘද්ධි ලාභීන් සංඛ්‍යාව 60,402 ක් වීම විගණනයේදී ප්‍රශ්නකාරී වූ අතර එම හේතුවෙන් සමෘද්ධි ප්‍රතිලාභ වලට හිමිකම් නොලබන පුද්ගලයින් 28,704 ක් වෙනුවෙන් රුපියල් මිලියන 958.4 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

4. තිරසාර සංවර්ධනය

තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරීන් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම පිලිබඳ ඇගයීමක් කිරීමට නොහැකි විය.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජේෂ්ඨ මට්ටමට අයත් නිළධාරී තනතුරු පුරප්පාඩු 16 ක්ද තෘතික මට්ටමට අයත් නිළධාරී තනතුරු පුරප්පාඩු 26 ක්ද ද්විතික මට්ටමට අයත් නිළධාරී තනතුරු පුරප්පාඩු 173 ක් හා ප්‍රාථමික මට්ටමට අයත් නිළධාරී තනතුරු පුරප්පාඩු 42 ක්ද වශයෙන් මුළු පුරප්පාඩු ප්‍රමාණය 257 ක් විය. මේ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ආයතනයේ "දැක්ම සහ මෙහෙවර" සඳහා ආයතනයේ අනෙකුත් සේවකයන් මෙහෙයවීමේ ගැටළු පැන නැඟී ඇති අතර තීරණ ගැනීමේ මට්ටමේ සේවක පුරප්පාඩු ප්‍රමාණය ඉහළ අගයක් ගැනීම ආයතන වල කාර්යසාධනයට අහිතකරව බලපා තිබුණි. තෘතියික, ද්විතියික සහ ප්‍රාථමික සේවක පුරප්පාඩු ප්‍රමාණය 241 ක්ව පැවති අතර, ආයතනයක ක්‍රියාකාරී සේවක පිරිස වනුයේ මෙම සේවකයින් වන බැවින් මෙලෙස පුරප්පාඩු පැවතීම ආයතනයේ ක්‍රියාකාරකම් වල කාර්යක්ෂමතාවයට හා ඵලදායිතාවයට අහිතකර ලෙස බලපා තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වර්ෂ 05 ක් ඉක්මවා සිටින නිලධාරීන් සම්බන්ධයෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබීම නිසා නගරයෙන් දුර බැහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීර්ඝ කාලයක සිට ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට අසාධාරණයක් සිදු වී තිබුණි

(ඇ) රාජ්‍ය අංශයේ ආයතනවල තනතුරුවලට බඳවාගැනීමත් වැටුප් හා දීමනා ලබාදීමත් සම්බන්ධව කළමණාකරන සේවා දෙපාර්තමේන්තු අංක 02/2020 හා 2020 ඔක්තෝබර් 26 දිනැති චක්‍රලේඛයේ 04 වන වගන්තියට අනුව මහ භාණ්ඩාගාරයේ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය නොලබා තම ආයතනයේ තනතුරු සඳහා බඳවාගැනීම් සහ තම ආයතනයේ සේවකයන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා වලට

ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් ගොඩනැගිලි හා ව්‍යුහයන් නඩත්තු කිරීමේ වියදම් එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි.

(ආ) සිවිල් ආරක්ෂක සේවාව සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවන ලද රුපියල් මිලියන 4.95 ක් අනෙකුත් සේවා (ප්‍රාදේශීය) විෂය අංක 271-1-2-0-1409 යටතේ ගිණුම්ගත නොකර අනෙකුත් සේවා (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) විෂය අංක 271-1-1-0-1409 යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනෙකුත් සේවා වියදම් එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි.

1.6.1.3 මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශන අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නොවන වාහනයකට අදාළ අළුත්වැඩියා කිරීමේ වියදම රුපියල් මිලියන 2.05 ක් අංක 271-1-1-0-2003 දරන වාහන පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වාහන නඩත්තු වියදම්, එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2021 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ ශේෂය රුපියල් මිලියන 105.48 ක් වුවද ඉකුත් වර්ෂයේ විවිධ අත්තිකාරම් ශේෂය, රුපියල් මිලියන 1.65 ක් ගිණුම්වලට (ACA-5) ගෙන නොනිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ භාණ්ඩාගාර ශුද්ධ වටිනාකම එම වටිනාකමින්ම ඌණ ගණනය වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිතයේ (SA 80) ජංගම නොවන වත්කම් ශේෂය රුපියල් මිලියන 1,638.45 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ හා සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA-82) 2021 ජනවාරි 01 දිනට එම ශේෂය පිළිවෙළින් රුපියල් මිලියන 1,692.61 ක්, රුපියල් මිලියන 1,575.32 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයේ අවසන් ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර වෙනස පිළිවෙළින් රුපියල් මිලියන 54.16 ක් හා රුපියල් මිලියන 63.12 ක් විය. මෙම වෙනස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

දෙපාර්තමේන්තු ප්‍රධානියා පෞද්ගලිකව වගකිව යුතු බවට සඳහන් කර තිබුනද මූතූර්, වෙරුගල් සහ කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන සංවර්ධන නිලධාරීන් 22 දෙනෙකු බඳවා ගැනීමේදී කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය නොමැතිව සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 10.53 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

ඊ.කේ.කේ.එස්.එදිරිසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය
2021 වසරේ වාර්ෂික සැලැස්මතුල අන්තර්ගත ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධනය

අංකය	විශේෂ දර්ශක (හඳුනාගත් ප්‍රමුඛ මහජන සේවාවන්)	අපේක්ෂිත වාර්ෂික ඉල්කක	සමුච්චිත ප්‍රගතිය	තත්‍ය ප්‍රතිඵල අපේක්ෂිත ප්‍රතිපලවල ප්‍රතිශතයක් ලෙස		
				100% - 90%	**75%- 89%**	**50% - 7$%**
1	උපත්, විවාහ, මරණ සහතික ලියාපදිංචිය	75,000	50,478	-	-	67.30%
2	ජාති හැඳුනුම්පත් සඳහා අයදුම්පත් සකස් කිරීම	25,000	7,769	-	-	31.07%
3	ඉඩම්බලපත්‍ර හා ඔප්පු සකස් කිරීම	500	15	-	-	3.00%
4	ආදායම් බලපත්‍ර අලුත් කිරීම හා නිකුත් කිරීම	65,000	28,700	-	-	44.15%
5	ගැබිණි මව්රුන් සඳහා පෝෂණ කූපන් නිකුත් කිරීම	8,500	7,363	-	86.62%	-
	සමස්ථ කාර්යසාධනය	**174,000**	**94,325**	**-**	**-**	**54.20%**

5. තිරසර සංවර්ධන අරුමුණු (එස්ඩීජී) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

අංකය	ප්‍රධාන විෂය ක්ෂේත්‍රය	මූලික ක්‍රියාකාරම්	තිරසාර සංවර්ධන අභිමතාර්ථ/අරමුණ		ප්‍රතිදානය (මූලික කාර්ය සාධන දර්ශකය)		සාධන ලබාගැනීමේ ප්‍රගතිය		
					ඉලක්කගත ප්‍රමාණය	සාධනය	0 %-49%	54%-74%	75%-100 %
1	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්	ස්වයං රැකියා සඳහා එළුවන්, කුකුළු පැටවුන් ලබා දීම	දිළිඳුකම තුරන් කිරීම, සෑම අතින්ම පවතින කුසගින්න තුරන් කිරීම	1.1.1 1.2.1 1.4.1 1.5.2 1.a.1	1,173	අදාප ප්‍රදේශයේ දිළිඳුකම 25% කින් අඩු වී ඇත	√		
2	ළමා පෝෂණය සහතික කිරීම	උදෑසන ආහාරය ලබා දීම	ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම පෝෂණය වර්ධනය කිරීම හා තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	2.1.1 2.2.1	6,491	පෝෂණය 30% කින්ද ප්‍රාථමික සාක්ෂරතාව 25% කින්ද වැඩි වී ඇත	√		
3	මහජනයාගේ සෞඛ්‍ය මට්ටම සහතික කිරීම	ළමා උද්‍යාන ඉදිකිරීම, ක්‍රීඩා පිටි, ක්‍රීඩාගාර අලුත්වැඩියා කිරීම	සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම සහ සෑම වයස් කණ්ඩයක් සඳහාම, ශරීර සුවතාව වර්ධනය කිරීම.	3.11 3.2.1	9,374 74,507	මහජන සෞඛ්‍ය සඳහා වියදම 25% කින් අඩු කර ඇත	√		
4	යටිතල පහසුකම් සංවර්ධනය	පාසල් ගොඩනැගිලි ඉදිකිරීම හා අලුත්වැඩියාව	පරිපූර්ණ සහ සාධාරණ අධ්‍යාපනයක් සුරක්ෂිත කිරීම සහ සෑමට ජීවිත කාලය පුරා අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කිරීම	4.1.1 4.2.1	29,219	සාක්ෂරතාව 25% කින්ද වැඩි වී ඇත	√		
5	සුරක්ෂිත පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම	ජල සැපයුම් ලබා දීම හා නලළිං ඉදිකිරීම	සියළු දෙනාටම ජලය සහ සනීපාරක්ෂාව ලැබීමේ අයිතිය හා තිරසාර ජල හා සනීපාරක්ෂාව කළමනාකරණය සුරක්ෂිත කිරීම	6.1.1 6.2.1 6.6.1	32,854 710 245	පානීය ජල සැපයුම් 45%. කින් වැඩි කර ඇත	√		
6	සියල්ලන්ටම බලශක්කිය ලබාදීම	විදුලිබල සම්බන්ධතා ලබාදීම	දැරිය හැකි විශ්වාසනීය,තිරසාර හා නූතන බලශක්තිය සියළු දෙනාටම ලැබීම සුරක්ෂිත කිරීම	7.1.1	1,788	විදුලි සැපයුම් 99% දක්වා වැඩි කර ඇත		√	
7	විධිමත් ප්‍රවාහන හා ප්‍රවේශ පහසුකම් සහතික කිරීම	මාර්ග හා කාණු පද්ධති ඉදිකිරීම හා අලුත්වැඩියාව	නම්‍යශීලි යටිතල පහසුකම් සංවර්ධ,තිරසාර හා පරිපූර්ණ කාර්මිකරණය හා නවෝත්පාදනය දිරිමත් කිරීම	9.1.1	47,956	මාර්ග 30% ඉදිකර ඇත. කාලය අපතේ යැවීම 50% කින් අඩු කර ඇත.	√		
8	අවධානම්සහගත	අවශ්‍ය ස්වයං රැකියා		10.1.1	74,561	කුටුම්භ ආදායම	√		

	ජනකණ්ඩායම් සවිබලගැන්වීම	පහසුකම් සැපයීම	රටවල් අතර අසමානාත්මතාව අවම කිරීම	10.2.1	502	50%, කින් වැඩි වී ඇත			
9	අලි මිනිස් ගැටුම් අවම කිරීම	අලිවැට ඉදිකිරීම	භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීම,ප්‍රතිසංස්කරණ තිරසාර භාවිතය උදෙසා ප්‍රවර්ධනය, වනාන්තර තිරසාර ලෙසකළමනාකරණය,කාන්තාකරණයට එරෙහිව සටන් කිරීම,	15.a.1	1,500	අලි මිනිස් ගැටුම් 50% අඩ කර ඇත		√	

5.2. තිරසර සංවර්ධ ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

ත්‍රීකුණාමලය දිස්ත්‍රික්කය වූ කලි කිලීන ස්භාවික විපත් හා දිගුකාලයක් පැවැති යුද්ධය නිසා පසුගාවීම තත්තවට පත් වූ දිස්ත්‍රික්කයකි. සිවිල් පරිපාලනය හා සාමාන්‍ය ජන ජීවිතය යලි ස්ථාපිත කිරීමත් සමඟ, ඉතා සීග්‍රයෙන් දියුණුවන දිස්ත්‍රික්කයක් බවට එය පති වී ඇත.

තිරසාර සංවර්ධන ඉලක්කයන් ලභාකර ගැනීම සමස්ථයක් ලෙස මෙම දිස්ත්‍රික්කයට අභියෝගයක් වන නමුත්, දිස්ත්‍රික්කයේ ප්‍රමුඛ අවශ්‍යතා හා තිරසාර සංවර්ධන අරමුණු 17 හි ඇතුලත් කරුණුද සැලැකිල්ලට ගනිමින් දිස්ත්‍රික් කාර්යාලයේ සංයුක්ත සැලැස්ම සකස් කර ඇත.

ඉහත අනු ශිර්ෂ 4.1 හි විස්තර කර ඇති පරිදි සැලැසුම් කර තිබූ ඉලක්කයන්ගෙන් බොහොමයක් අපේක්ෂිත මට්ටමට ළභාකර ගැනීමට හැකි වී ඇත. එමෙන්ම දිස්ත්‍රික් ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා තව බොහෝ දුර යාමට ඇත.

සාමාන්‍ය ජන ජීවිතයේ ඇති වන දූව්චාවචන තත්ත්වයන්, ආර්ථිකයේ ඇති වන උච්චාවචනයන් මෙන්ම ත්‍රස්ථවාදි කටයුතු හා ස්භාවික විපත් නිසා නීතිය හා සාමය පවත්වාගෙන යාමට ඇති වන බාධාවන් නිසා සැලැසුම් කළ කාර්යයන් එහි උපරිමයෙන් ස්ථාපනය කිරීමට අපහසු මෙන්ම එහි ප්‍රතිඵල සැලසුම් කළ ආකාරයටම ළබා ගැනීම අභියෝගයක් ව පවතී.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	52	36	16
තෘතීයික	48	22	26
ද්විතීයික	1,014	900	114
ප්‍රාථමික	144	113	31
	1,258	**1,071**	**187**

6.2. ආයතනයේ කාර්ය සාධන උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

ත්‍රීකුණාමලය දිස්ත්‍රික්කයේ සමස්ථයක් ලෙස කාර්ය මණ්ඩයෙන් අනුමත මට්ටමට වඩා 114 ක ඌණතාවක් පවති. කාර්ය මණ්ඩලයේ හිඟයක් පැවැතීම පෙර වසර වල දිගින් දිගටම පැවැති ගැටළුවක් වන නමුත් මෑතකාලී දෙවසර වන විට එම හිඟය අඩුකැගැනීමට හැකි වී ඇත.

දිස්ත්‍රික්කයේ සිවිල් ජනයා වෙත සිය සේවාන් ඉටු කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආශ්‍රිකව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තෘතීක මට්ටමේ නිලධාරී ඌණතාවය දැඩිව බලපා ඇත. දැනට සිටින තත්‍ය කාර්ය මණ්ඩලයට සමානුපාතිකව ජ්‍යෙෂ්ඨ හා තෘතීක මිට්ටමේ නිලධාරීන්ගේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 58 ක් හා 42 ක මට්ටමක පවතී. මෙම තත්ත්වය දෛනික පරිපාලන තත්තවයට දැඩිව බලපානු ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු)		වැඩසටහනේ ස්භාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ප්‍රාදේශීය හා ග්‍රාමීය සංවර්ධනය	31	එක් දින	19,663.00		දේශීය	ග්‍රාමීය සංවර්ධනය
කාර්යාල පරිපාටි හා කාර්යාල ක්‍රම - (T)	26	එක් දින	13,394.00		දේශීය	කාර්යාල ක්‍රම
කාර්යාල පරිපාටි හා කාර්යාල ක්‍රම - (S)	19	එක් දින	10,930.00		දේශීය	කාර්යාල ක්‍රම
කා.කා.ස සඳහා ප්‍රායෝගික පුහුණු (T)	16	එක් දින	9,340.00		දේශීය	කාර්යාල ක්‍රම
කා.කා.ස සඳහා ප්‍රායෝගික පුහුණු (S)	21	එක් දින	13,242.75		දේශීය	කාර්යාල ක්‍රම
රාජ්‍ය සේවා රියදුරන්ගේ වගකීම	11	එක් දින	8,485.00		දේශීය	වාහන නඩත්තුව
කාර්යක්ෂමතා කඩයිම් 1 පංතිය රජ්‍ය කළ. ස. (T)	13	දස දින	100,081.63		දේශීය	මූ.රෙ. හා ආ. සංග්‍රහය
ආයතනික ඵලදායිතාව	30	එක් දින	21,263.70		දේශීය	ඵලදායිතාව
මූලික ඉදිකිරීම් ශිල්පක්‍රම (3)	180	එක් දින	95,813.69		දේශීය	මූලික ඉදිකිරීම් ශිල්පක්‍රම
රාජ්‍ය වත්කම් කළමනාකරණය	32	එක් දින	19,717.00		දේශීය	රාජ්‍ය වත්කම් කළමනාකරණය
ව්‍යාපෘති කළමනාකරණය	33	එක් දින	21,160.40		දේශීය	ව්‍යාපෘති කළමනාකරණය
කාර්යක්ෂමතා කඩයිම් 1 පංතිය රජ්‍ය කළ. ස. (S)	6	දස දින	67,232.96		දේශීය	මූ.රෙ. හා ආ. සංග්‍රහය
ප්‍රසම්පාදන කාර්යය පරිපාටිය	31	දෙදින	30,769.28		දේශීය	ප්‍රසම්පාදනය
මහජන සම්බන්ධතා	34	එක් දින	21,144.60		දේශීය	මහජන සම්බන්ධතා
සංනිවේදන කුසලතා	27	එක් දින	19,804.60		දේශීය	සංනිවේදන කුසලතා
අල්ලස් හා දූෂණ	19	එක් දින	19,044.00		දේශීය	අල්ලස් හා දූෂණ වැලැක්වීම
නායකත්ව හා ධාරිතා සංවර්ධන	80	දෙදින	110,600.00		දේශීය	නායකත්ව හා ධාරිතා සංවර්ධන
එකතුව			601,686.61			

ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද කෙටියෙන් පැහැදිලි කරන්න

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපනය කර ඇති දිස්ත්‍රික් කුසලතා සංවර්ධන ඒකකය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යායේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාවල දැනට සිටින කාර්ය මණ්ඩලයේ හා අලුතින් එක්වන කාර්යය මණ්ඩලයේ දැනුම, කුසලතා, ආකල්ප සහ නිපුණතා වැඩිදියුණු කිරීම සිදු කරනු ලබයි. සේවකයන්ගේ දෛනික සේවා සැපයීම සඳහා අවශ්‍ය වන සීමිත සහ තෝරාගත් ක්ෂේත්‍රවල මූලික පුහුණු ලබාදීම සිදු කරනු ලබයි. මෙය දිස්ත්‍රික් ලේකම් කාර්යාලේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාවල සේවකයන්ගේ සේවා ඵලදායි බව ඉහළ නැංවීම සඳහා බෙහෙවින් උපකාරී වී ඇත.

එමෙන්ම නැගෙනහිර පළාත් සභාවේ හා දාස්ත්‍රික්කයේ ඇති වෙනත් දෙපාර්තමේන්තු වල කාර්යය මණ්ඩලය ද මේ සඳහා

මේ වන විට බොහෙමයක් ම රාජ්‍ය සේවා ලබාදීමේ ක්‍රම වේද නව තාක්ෂණය සමඟ සමපාතව ඇති නිසා සෑම කාර්යය මණ්ඩලයේ අයකුම එම දැනුම ලබාගැනීම අනිවාර්යය කර ඇත. එමෙන්ම භාෂා කුසලතා ලබැගැනීම, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය සහ වෙනත් රැකියාව සම්බන්ධ දැනුම පුහුණුව ලබා ගැනීම ප්‍රමුඛ අවශ්‍යතාවක් කොට සලකනු ලැබේ. මෙමගින් අවසාන වශයෙන් අපේක්ෂා කරනුයේ රාජ්‍ය සේවාවේ ඵලදායි බව ඉහළ නැංවීමයි.

07. පරිච්ඡේදය අනුකූලතා වාර්තාව

අදාල කරගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල කොවීමට කෙටි පැහැදිළි කිරීම	අනනුකූලබව වලක්වා ගැනීමට ක්‍රියාමර්ග
1. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම්			
1.1. වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3. ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.4. ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5. විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6. වෙනත්	අදාල නොවේ		
02. පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)			
2.1.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/218 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන් කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.2. පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩිපත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3. විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4. අභ්‍යන්තර විගණන වාර්තා ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5. සියළුම මාසික ගිණුම් සාරාංශ (සිගාස්) පිළියෙළ කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6. චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7. ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8. තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9. හානි/පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10. බැරකම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11. උප පත්‍රිකා පොත් ලේඛනය (ජීඒ - එන්20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
03. මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)			

3.1. මූල්‍ය බලතල ආයතනය තුල පවරා දී තිබීම	අනුකූලවේ		
3.2. මූල්‍ය බලතල පවරා දීම ආයතනය තුල පවරා දී තිබීම	අනුකූලවේ		
3.3. සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූලවේ		
3.4. 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රාජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත් ව කටයුතු කිරීම	අනුකූලවේ		
04. වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම	අනුකූලවේ		
4.3. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.4. වාර්ෂක අයවැය ඇස්තමේන්තු සක්ස කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
5. විගණන විමසුම්			
5.1. විගණකාධිපතිවරයා විසින් නියමිත කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූලවේ		
06. අභ්‍යන්තර විගණනය			
6.1. මු.රෙ. 134 (2), DMA/1-2019, අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
6.2. සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ		
6.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(04) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
6.4. මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
07. විගණන හා කළමනාකරණ කමිටු			
7.1. සීඑම්ඒ චක්‍රලේඛ 01- 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාල වර්ෂය තුල පවත්වාගෙන තිබීම	අනුකූලවේ		
08. වත්කම් කළමනාකරණය			
8.1. අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු	අනුකූලවේ		

කොමිප්ට්‍රෝලර් ජනරල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම			
8.2. ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු නිලධාරියකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යොමු කිරීම	අනුකූලවේ		
8.3. රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාන්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපත්වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම	අනුකූලවේ		
8.5. ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ.772 අනුව සිදු කිරීම	අනුකූලවේ		
09. වාහන කළමනාකරණය			
9.1. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2. වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	කොවිඩ් 19 අවහිරතා නිසා නොහැකි විය	2022 වසරේදී නිමකරනු ඇත
9.3. වාහනයේ ලොග් පොත් පවත්වා ගනිමින් යාවත්කාලීක කර තිබීම	අනුකූලවේ		
9.4. සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලවේ		
9.5. 2016-12-29 දිනැති අංක 2016-/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා	අනුකූලවේ		
9.6 කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අදාල නොවේ		
10. බැංකු ගිණුම් කළමනාකරණය			
10.1නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
10.2. සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල ඉදිරියට ගෙන අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලවේ		
10.3. බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
11. ප්‍රතිපාදන උපයෝජනය			
11.1 සලසා තිබුණු ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ		

11.2. මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූලවේ		
12. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම			
12.1. සීමාවන් වලට අනුකූල වීම	අනුකූලවේ		
12.2. හිග හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම	අනුකූලවේ		
12.3. වර්ෂයකට වැඩි කාලයක් සිට පැවත එන හිග හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලවේ		
13. පොදු තැන්පත් ගිණුම			
13.1. කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ		
13.2. පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
14. අග්‍රිම ගිණුම			
14.1. සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුය වෙත ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ		
14.2. මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
14.3. මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලවේ		
14.4. අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15. ආදායම් ගිණුම			
15.1. අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූලවේ		
15.2. රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම	අනුකූලවේ		
15.3. මු.රෙ. 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ගිබීම	අනුකූලවේ		
16. මානව සම්පත් කළමනාකරණය			
16.1. අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
16.2. කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලවේ		
16.3. 20.09.2017 දිනැති එම්එස්ඩී චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
17. මහජනයා වෙත තොරතුරු ලබාදීම			

17.1. තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු ලබාදීමේ නිලධාරියකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
17.2. ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා පබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රසංසා/චෝදනා ප ල කිරීමට පමසුකම් සලසා තිබීම	අනුකූලවේ		
17.3. තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
18. පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1 අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූලවේ		
18.2. එම චක්‍රලේඛයේ 2.3. ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19. මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1. 2018-01-24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්ම සකස්කොට තිබීම	අනුකූල නොවේ	සැලැස්ම යාවත්කාලීන කළ යුකුව ඇත	2022 වසරේදී නිම කෙරේ
19.2. කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	කොවිඩ් 19 සීමා නිසා සම්පූර්ණ කර නැත	
19.3. ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	2022 වසරේදී නිවැරිදිව සම්පූර්ණ කරනු ඇත	
19.4. ඉහත චක්‍රලේඛයේ 6.5. ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබීම	අනුකූල නොවේ	වගකීම පැවරූ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කරනු ඇත	
20. විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1. ඉකුත් වාර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරිදි කොට තිබීම	අනුකූලවේ		